
# රොනීගේ ආර්ථික පාඩම

**ශ්‍රී ලංකා මහ බැංකුවේ හිටපු නියෝජ්‍ය අධිපති**
**ආචාර්ය ඩබ්ලිව්. ඒ. විජේවර්ධන විසිනි**
2024 මාර්තු 4 වැනි දින Daly FT පුවත්පතේ පළවු
Ronie de mel A true democrat and economics Phlosopher to the end
**ලිපියේ පරිවර්තනය - සමන් පුෂ්ප ලියනගේ**

හිටපු මුදල් ඇමතිවරයකු ලෙස සැමදෙනා හොඳින් දැන සිටි රොනී ද මැල් තවත් අප අතර නොසිට නික්ම ගොසිනි. සියවසකට එක් වර්ෂයක් අඩු වූ ඔහුගේ දීර්ඝ ජීවිත කාලය තුළ හෙතෙම විවිධ කර්තව්‍යයන්ට, යොමුව සිටියේය. 1947 දී යුනිවර්සිටි ඔෆ් සිලෝන් වෙතින් ඉතිහාසය සම්බන්ධයෙන් පළමු පන්තියේ ගෞරව උපාධියක් දිනාගෙන සිය ජීවිත කාලය පුරා ඉතිහාසය පිළිබඳ ශිෂ්‍යයෙක්ව සිටියේය. විශ්වවිද්‍යාලයේ විද්වතකු ලෙස රැඳී සිටියේ නම් ඔහු අපේ කාලයේ වඩාත් ගෞරවණීය ඉතිහාසඥයකු වන්න ඉඩ තිබිණි. එහෙත් දෛවය ඔහු වෙනතක හරහා යැවුයේය.



1948 දි හෙතෙම ගෞරවණීය ලංකා සිවිල් සේවාව සිය වෘත්තීය ජීවිතය ලෙස තෝරා ගත්තේය. එම වෘත්තීය ජීවිතය තුළ ඔහු බොහෝ තනතුරු හෙබවූ මුත් ඔහු පැවසූ ආකාරයට ඔහුට වඩාත් බලපෑ තනතුරු වූයේ 1950 ගණන්වල අග භාගයේ ඔහු හෙබවූ කෘෂිකර්ම අමාත්‍යාංශයේ සහකාර ලේකම් පදවියයි. එවකට කෘෂිකර්ම අමාත්‍යවරයා වූයේ තවත් දේශපාලන දැවැන්තයකු වූ පිලිප් ගුණවර්ධනය. ඔහු අමාත්‍යාංශයේ තවත් කිහිප දෙනකු සමග එක්වී කුඹුරු පනත නිර්මාණය කරන්නටත්, ජාතික මට්ටමෙන් අලුත් සමුපකාර බැංකුවක් සඳහා සැලැස්ම සකස් කරන්නටත් පිලිප්ට උදව් කළේය. ඒත් පළමුවැන්න ඔහු කෘෂිකර්ම අමාත්‍යාංශයේ සිටියදී සාර්ථකව නිමා කළේය. එහෙත් දෙවැන්න එළි දකින්නට යම් කාලයක් ගතවිය. එම කර්තව්‍ය සාර්ථකව නිමාවූයේ සමුපකාර බැංකුව ලෙස නොව මහජන බැංකුව ලෙසයි. සමුපකාරය ද එහි කොටස්කරුවෝ වූහ.

රොනීගේ දක්ෂතාව හා නිපුණත්වයේ තරම සාම්ප්‍රදායික රජයේ නිලධාරියකුට වඩා බොහෝ සෙයින් පුළුල් වූවකි. එම නිසා ඔහු 1964 දී රාජ්‍ය සේවයෙන් අස්වී දේශපාලන පොරපිටියට වැදි 1965 මහ මැතිවරණයෙන් පරාජයට පත් වුයේය. එහෙත් ඊට පසු කලෙක පාර්ලිමේන්තුවට පිවිස 1990 දක්වා පාර්ලිමේන්තුවේ රැඳී සිටියේය. කෙසේ වුවද ඔහුගේ ප්‍රධාන දායකත්වය වුයේ 1977 ජේ.ආර්. ජයවර්ධනගේ ආණ්ඩුවට මුදල් අමාත්‍යවරයා ලෙස ලබාදුන් දායකත්වයයි. දිවංගත ලලිත් ඇතුලත් මුදලි සමග එක්ව 1977 නිදහස් වෙළඳපොළ ආර්ථික ක්‍රමය ක්‍රියාත්මක කිරීමට ඔහු ජේ.ආර්ට සහාය දැක්වුවේය. එය ශ්‍රී ලංකාවට ආර්ථික ප්‍රතිපත්ති උපාය මාර්ගයන්හි නව යුගයක් උදාකරදීමකි.

රොනීගේ දක්ෂතාව හා නිපුණත්වයේ තරම සාම්ප්‍රදායික රජයේ නිලධාරියකුට වඩා බොහෝ සෙයින් පුළුල් වූවකි. එම නිසා ඔහු 1964 දී රාජ්‍ය සේවයෙන් අස්වී දේශපාලන පොරපිටියට වැදි 1965 මහ මැතිවරණයෙන් පරාජයට පත් වුයේය. එහෙත් ඊට පසු කලෙක පාර්ලිමේන්තුවට පිවිස 1990 දක්වා පාර්ලිමේන්තුවේ රැඳී සිටියේය. කෙසේ වුවද ඔහුගේ ප්‍රධාන දායකත්වය වුයේ 1977 ජේ.ආර්. ජයවර්ධනගේ ආණ්ඩුවට මුදල් අමාත්‍යවරයා ලෙස ලබාදුන් දායකත්වයයි. දිවංගත ලලිත් ඇතුලත් මුදලි සමග එක්ව 1977 නිදහස් වෙළඳපොළ ආර්ථික ක්‍රමය ක්‍රියාත්මක කිරීමට ඔහු ජේ.ආර්ට සහාය දැක්වුවේය. එය ශ්‍රී ලංකාවට ආර්ථික ප්‍රතිපත්ති උපාය මාර්ගයන්හි නව යුගයක් උදාකරදීමකි.

## ආවෘත ආර්ථික ප්‍රතිපත්තිවල අනුවණකම

වසර ගණනාවක් ගතවූ පසු 2020 දී පෞද්ගලික අංශයේ බුද්ධි මණ්ඩලයක අනුග්‍රහය ලබන ඇඩ්වොකාටා යූ ටියුබ් නාලිකාව සමග කෙටි සංවාදයක යෙදෙමින් ඔහු 1977ට පෙර ශ්‍රී ලංකාවේ පැවති ආර්ථික ක්‍රමය මතක් කරමින් විස්තර කළේය. සීනි නැතුව තේ බොනවා සහ හාල් නැතුව බත් කනවා යනුවෙන් ගී ගයන්නට තරම් එවකට ජනතාව මුළා කළ බව හෙතෙම පැවසීය. එම ක්‍රමය ක්‍රියාත්මක කිරීමට සහල්වල සිට පිටි දක්වාත් සීනි, පරිප්පු, පෙට්‍රෝල්, ඩීසල් දක්වාත් (ඒ කිහිපයක් පමණි) සැම දේම පාලනය කරනු ලැබුවේය. නැතහොත් ඒවා උදෙසා සළාක ක්‍රම ඇති කරනු ලැබීය. බ්‍රිතාන්‍යයේ ලංකාව පාලනය කරන කාලයේ පැවතියේ ආවෘත ආර්ථිකයක් නොවේ.

මෙම කාරණය ඔහු තවදුරටත් පහත ආකාරයෙන් විස්තර කළේය.

*"1947 බලයට පැමිණි එ.ජා.ප. ආණ්ඩුව මෙම බ්‍රිතාන්‍ය ප්‍රතිපත්ති නොකඩවා ක්‍රියාත්මක කරනු ලැබ ඒ වෙනුවෙන් දෝෂ දර්ශනයට ලක්වුණා. ඔවුන් බ්‍රිතාන්‍යයන්ගේ ගැත්තන් ලෙස අවඥාවට භාජන කරනු ලැබුවත් එම විවෘත ප්‍රතිපත්ති 1956 දක්වා නොකඩවා ක්‍රියාත්මක වුණා. 1956 බණ්ඩාරනායක මහතා බලයට පත් වූ විට ඒ වනවිට සමාජවාදී අදහස් දැරූ ඇතැමුන් ඔහු විසින් ආණ්ඩුවට ගෙන එනු ලැබුවා. බණ්ඩාරනායක මහතා ලංකා සමසමාජ පක්ෂයේ හෝ කොමියුනිස්ට් පක්ෂයේ හෝ පිලිප් ගුණවර්ධනගේ පක්ෂයේ සාමාජිකයකු නොවුවත් ඔහු එසේ කළා. ඔහු ගෙන එනු ලැබුවේ විවිධ සේවා සමුපකාර සංගම් වැනි ඇතැම් දැඩි නොවු සමාජවාදී ප්‍රතිසංස්කරණ"*

එහෙත් වැඩි කාලයක් අඛණ්ඩව ඒවා පැවතුණේ නැත. දැඩි සමාජවාදි ප්‍රතිපත්ති හඳුන්වාදෙනු ලැබුවේ 1970 වසරේ තුනෙන් දෙකේ බහුතරයකින් බණ්ඩාරනායක මැතිනියගේ ශ්‍රීලනිප පක්ෂය ජයගත් පසුවයි. එහි සාමාජිකයකු ලෙස ශ්‍රීලනිප අවසර පත්‍රයෙන් තමා ද පාර්ලිමේන්තුවට තේරී පත් වූ බව හෙතෙම කියා සිටියේය.

ආණ්ඩුව පළමු අවුරුදු දෙක තුළම ආර්ථිකය අවුල් සහගත තත්වයට පත් කර ගත්තාය. එම නිසා මම ඉල්ලා අස්වී ස්වාධීන මන්ත්‍රීවරයකු ලෙස කටයුතු කළා. පාර්ලිමේන්තුව තුළ ස්වාධීනව කටයුතු කළ තව කිහිප දෙනෙකු සිටියා. අප දේශපාලන පක්ෂයකට බැඳී නොසිටි නිසා, අපට පක්ෂයේ වැඩ පිළිවෙළ අනුගමනය නොකර කතා කළ හැකි වුණා. පාර්ලිමේන්තුව තුළ හොඳම කතා පැවැත්වූයේ එම මන්ත්‍රීවරුයි.

මහ බැංකු සම්බන්ධයෙන් රොනීගේ නිරීක්ෂණ වූයේ මේවාය. ලෝකයේ මෙම කලාපයේ ශ්‍රී ලංකාවේ මහ බැංකුව ද ඇතුළුව වඩාත් කාර්යක්ෂම මහ බැංකු වූයේ සිංගප්පූරුව සහ හොංකොං යන රටවල මහ බැංකුය. එහෙත් ඉන්දියා, පාකිස්තානය හා බංග්ලාදේශය යන රටවල මහබැංකු ශ්‍රී ලංකාවේ මහ බැංකුවටත් වඩා අන්ත නරක විය. සිංගප්පූරුව සහ හොංකොං යන රටවල මහ බැංකු සාර්ථක වූයේ එම රටවල විවෘත ආර්ථික ප්‍රතිපත්ති නොකඩවා පවත්වාගෙන ආ නිසාය. ඔවුහු සමාජවාදී ක්‍රමයට අනුගත නොවූහ. ඔවුහු විවෘත ආර්ථික ක්‍රම වර්ධනය කරමින්, ඒවා නවීකරණය කරමින් පසු වූහ. රොනී ද මැල් පවසන ආකාරයට ඔවුන්ගේ සාර්ථකත්වයේ රහස වූයේ එයයි. රොනී ද මැල්ගේ අදහස වූයේ, හොඳ නම්‍ය වූ ආර්ථික ප්‍රතිපත්ති පැකේජයක් රට අනුගමනය කළහොත් එහි මහ බැංකුව ද වටිනා ආයතනයක් බවට පත් වන්නේය යන්නයි.

## උද්‍යෝගී වැවිලිකරුවෙක්

රොනී විශේෂඥ දැනුම ලද්දේ ඉතිහාසය සම්බන්ධයෙනි. අත්දැකීම් හා පළපුරුද්ද ලද්දේ රජයේ සේවයෙන් හා තේ සහ රබර් යන වැවිලි දෙකේම